**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය - 2017**

**-----------------------------------------------------**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ 13(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජුනි 08 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රමිතයෙහි 49 ඡේදයට අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම් පන්තියට අයත්වන සියළුම වත්කම් මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, එයට පටහැනිව ආයතනය සතු වාහන 08 ක් අතුරින් වාහන 06 ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ii) 2016 වර්ෂයේදි ප්‍රත්‍යාගණනය කරන ලද වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේදි ජනාධිපති ලේකම් කාර්යාලය වෙත මාරු කර තිබුණද, එම වාහන දෙකට අදාලව ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලද රු.5,750,000 ක් ප්‍රමිතයෙහි 55 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන සංචිතයෙන් සමුච්චිත අතිරික්තයට/ ඌණතාවයට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.9,612,620 ක් වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

ආයතනයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

වායු සමීකරණ යන්ත්‍ර 03ක් සවිකිරිමේ කොන්ත්‍රාත්තුවට ගෙවන ලද රු.1,821,600 ක් වූ ශුද්ධ වටිනාකම පමණක් ගිණුම්ගත කිරීම නිසා රඳවාගත් මුදල් සහ වත්කම් රු.176,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආරක්ෂන සේවා සහ පිරිසිදු කිරිමේ සේවා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් තැන්පත්කර තිබූ ආපසු ගෙවනු ලබන එකතුව රු.120,000 ක් වූ තැන්පතු නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයේ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු වටිනාකම රු.55,000 ක් විය.

(ආ) සේවය හැර ගොස් ඇති ආයතනයේ සේවකයකුගෙන් 2014 වර්ෂයේ සිට අයවිය යුතු රු.19,898 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනය මඟින් මෙහෙයවනු ලැබූ පාඨමාලාවන් සඳහා රාජ්‍ය ආයතන 02 කින් ලැබිය යුතු එකතුව රු.1,265,800 ක් වර්ෂ 02 සිට වර්ෂ 03 කාල පරාසයක් තුළ අය නොවී පැවතුණි.

### 2.4 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි /2002/ 02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.9,612,620 ක පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1(ආ)මාර්ගෝපදේශය | මයිලෝමීටරය එකම අගයක් ගෙන තිබියදී මෝටර් රථයක අවස්ථා 02 කදි රු.312,613 ක්වූ අළුත්වැඩියාවක් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.59,809,832 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.23,080,772 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.82,890,604 ක පිරිහීමක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර ප්‍රදාන රු.16,550,849 කින් අඩුවීම සහ පුහුණු වියදම් රු.36,712,133 කින් හා පරිපාලන වියදම් රු.36,129,962 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ පැවති රු. 15,608,863 ක ඌනතාවය 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී 2017 වර්ෂයේදී රු.59,809,832 ක ඌනතාවයක් බවට පිරිහී තිබුණි. එසේ වුවද, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2013 වර්ෂයේ රු.1,466,729 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු.49,025,649 ක් දක්වා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණ ද, 2017 වර්ෂයේදී එය රු.26,829,859 ක සෘණ අගයක් දක්වා පිරිහී තිබුණි.

## 3.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

2016 වර්ෂයේදී 15:1 ක් වූ ජංගම අනුපාතය 2017 වර්ෂයේදී 0.9:1 දක්වාද ක්ෂණික අනුපාතය 15:1 සිට 0.8:1 දක්වාද පිරිහී තිබුණි. අමාත්‍යාංශයෙන් අරමුදල් ලැබේ යන අපේක්ෂාවෙන් පැවැත්වූ පාඨමාලා වෙනුවෙන් ගෙවිය යුතු වියදම් ජංගම බැරකම් තුල අන්තර්ගත වීම ඊට හේතු වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ක්‍රියාකාරී සැලැස්ම අනුව වූ අරමුණු ඉටුකර ගැනීමට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 990,000 ක් වූ පුහුණුකරන්නන් පුහුණු කිරීම සඳහා සහතිකපත්‍ර පාඨමාලාවක් සහ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් පැවැත්වීමටත් ඒ සඳහා වැඩසටහන් 06 ක් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. 2017 වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව රු.23,995 ක් වැයකර එක් සහතිකපත්‍ර පාඨමාලාවක් පමණක් පවත්වා පුද්ගලයන් 06 දෙනෙකු පුහුණු කිරීම පමණක් සිදුකර තිබුණි.

(ආ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව සඳහා විෂය නිර්දේශ සකස් කිරීම,සිංහල හා දෙමළ දෙවන භාෂාව ඉගැන්වීමේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් පැවැත්වීමට, හා රජයේ නිලධාරින් සඳහා "නවමු" පාඨමාලා 10 ක් පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.2,140,000 ක් යටතේ සැලැසුම් කර තිබුණද, වර්ෂය තුළදී ක්‍රියාත්මකව පැවතියේ රු.27,350 ක් වැයකර "නවමු" පාඨමාලා එකක් පමණක් විය.

(ඇ) මට්ටම් 04 ක් යටතේ ජාතික භාෂා පුහුණු පාඨමාලා 144 ක් පැය 6850 කින් ආවරණය කිරීමට රු.3,190,000 ක් ප්‍රතිපාදනය කර තිබුණි.එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,774,325 ක් වැයකර පාඨමාලා 34 ක් පැය 3958 කින් ආවරණය කර තිබුණි. ඒ අනුව පැවැත්වූ පාඨමාලා ප්‍රමාණය සියයට 23 ක් හා යෙදවූ පැය ප්‍රමාණය සියයට 58 ක් වැනි අඩු ප්‍රමාණයක් විය.

## 4.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "සමාජ පරිවර්තන සහ ඒකාබද්ධතා ව්‍යාපෘති සඳහා පහසුකරණය" ව්‍යාපෘතියෙන් 2017 මාර්තු 29 දින පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ කාර්යාල උපකරණ අයිතම 176 න් අයිතම 33 ක් පමණක් භාවිතයට ගෙන තිබුණු අතර ඉතිරි අයිතම 143 ක් විගණන අවස්ථාව වූ 2018 ජූලි 31 වන විටද ආයතන පරිශ්‍රය තුල නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් මාසයේදී රු. 814,231 ක් වැයකර අගලවත්ත පුහුණු ආයතනය සඳහා මිලදී ගෙන තිබූ ජෙනරේටරය විගණන දිනය වූ 2018 ජුලි 31 දින වනවිටත් ස්ථාපිත කර නොතිබූ අතර මෙම ජෙනරේටරය සඳහා වූ වසරක වගකීම් කාලයද ඉක්ම ගොස් තිබුණි.

**4.3 අනාර්ථික ගනුදෙනු**

---------------------

ආයතනය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් කුලී පදනම මත 2017 ජනවාරි 01 දින සිට වසර 02 ක කාලයකට ලබාගැනීම සඳහා රු.30,000,000 ක කුලී ගිවිසුමකට 2016 දෙසැම්බර් මස එළඹ රු.11,250,000 ක අත්තිකාරම් මුදලක්ද ගෙවා තිබුණි. එහෙත් අදාල ගොඩනැගිල්ලේ ආයතනය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසාදීමට ගොඩනැගිලි හිමිකරු විසින් 2017 අප්‍රේල් දක්වා ප්‍රමාදවීම හේතුවෙන් නව ගොඩනැගිල්ල තුල ආයතනය ස්ථාපිත කිරීම 2017 මැයි දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ හේතුවෙන් 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාලව ගොඩනැගිලි කුලිය හා ඊට අදාල බදු මුදල් ලෙස ගෙවා තිබූ රු.5,865,000 ක ප්‍රමාණය අනාර්ථික ගනුදෙනුවක් බවට පත්ව තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම**

---------------------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 'න්‍යාය පත්‍රය'ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ දායක විය යුතුද, යන්න පිලිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශව හඳුනාගෙන ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පාසැල් සිසුන් සඳහා දෙමළ/සිංහල /ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ලබාදීම ඉලක්කයක් ලෙස හඳුනාගෙන තිබුණද, අධ්‍යාපන අමාත්‍යාංශය අරමුණු ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන සංදිස්ථාන හඳුනාගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:3 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව විගණන අවස්ථාව වූ 2018 ජුලි 31 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා කාර්යපටිපාටි සංග්‍රහයක් පිළියෙල කිරීම වෙනුවෙන් 2014 නොවැම්බර් 04 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වෙත රු.45,000 ක් ගෙවා තිබුණද, එම කෙටුම්පත සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබීම හේතුවෙන් එය ආයතනයේ කාර්යයන් ඉටු කිරීමේදී භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) 2015 භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ භාණ්ඩ 20 ක වූ ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව විගණිත දිනය වූ 2018 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී . පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | පාඨමාලාවන්ට අදාල හිඟ ආදායම් අයකර නොගැනීම සහ ඉකුත් වර්ෂවලට අදාල ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) ප්‍රසම්පාදන කටයුතු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට පටහැනිව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබීම. |